මගේ අංකය -දපස/සමු.සං/ සං/ 18
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
පෙට්ටිගලවත්ත - ගාල්ල
2020.04. ૨૪

දකුණු පළාතේ විවිධ සේවා සමුපකාර සමිති, ස.ණ.ස. සමිති ඇතුළු සියළුම
සමුපකාර සමිතිවල ගරු සභාපතිවරුන් වෙත,

**<u>පාර්ලිමේන්තු මැතිවරණ කාල සීමාව තුළ සමුපකාර සමිති විසින් අනුගමනය කල යුතු කරුණු සම්බන්ධවයි</u>**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සඳහා වන මහමැතිවරණය 2020.06.20 දින පැවැත්වන බව මැතිවරණ කොමිෂන් සභාවේ අංක 2171/3 හා 2020.04.20 දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රසිද්ධ කර ඇත.

02. ඒ අනුව මෙම මැතිවරණ කාල සීමාව තුළ සමුපකාර සමිති විසින් පහත දක්වා ඇති පොදු උපදෙස් අනුගමනය කරන ලෙස කාරුණිකව දන්වමි.

i. කිසිදු දේශපාලන පක්ෂයක්/ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වන ආකාරයෙන් හෝ යම් දේශපාලන පක්ෂයක්/ ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙක් අගතියට පත් වන ආකාරයෙන් කටයුතු නොකළ යුතු අතර එහිදී සමුපකාර සමිති සතු වාහන, ගොඩනැගිලි, ඉඩම් ඇතුළු නිශ්චල හා චංචල දේපළ අනිසි ලෙස දේශපාලන කටයුතු සඳහා භාවිතා කිරීමට ඉඩ නොදිය යුතුය.

ii. සමුපකාර සමිති පරිශ්‍රය තුළ දේශපාලන ප්‍රචාරක කටයුතු කිරීමට කිසිදු දේශපාලන පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට අවස්ථාවක් ලබා නොදිය යුතුය.

iii. තම සේවකයින්ට රාජකාරී කාල සීමාව තුළ ක්‍රියාකාරී දේශපාලන කටයුතු කිරීමට ඉඩ නොදිය යුතුය.

iv. සාමාන්‍ය කාල සීමා වලදී කිසියම් දේශපාලන පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට හෝ පුද්ගලයෙකුට මුදල් ගෙවා වෙන් කර ගත හැකි සමුපකාර සමිති සතු නිශ්චල හා චංචල දේපළ දේශපාලන කටයුතු සඳහා භාවිතා කිරීමට නිසි පරිදි ඉල්ලුම් කරනු ලබන දේශපාලන පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තු අය කර ගැනීමෙන් හා අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කිරීමෙන් පසු සුදුසු පරිදි අවස්ථාව ලබා දිය හැකි අතර, එවැනි අවස්ථාවක සමුපකාර සමිතියේ දෛනික කටයුතු අඩාල නොවන බවට සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා සාමාන්‍යාධිකාරී සහතික විය යුතුය. තවද මෙහිදී සෑම දේශපාලන පක්ෂයකටම/ ස්වාධීන කණ්ඩායමකටම හෝ අපේක්ෂකයෙකුටම සාධාරණ අවස්ථාවක් ලැබෙන පරිදි විනිවිදභාවයෙන් යුතුව කටයුතු කල යුතු අතර ඒ සඳහා සුදුසු පූර්ව සැලැස්මක් සකස් කර ගත යුතුය. එසේම සමුපකාර සමිති සතු නිශ්චල හා චංචල දේපළ බද්දට හෝ කුලියට ලබා දෙනු ලබන ආකාරය, ඒ සඳහා වන කොන්දේසි මොනවාද යන්න පැහැදිලිව නිශ්චය කර ගෙන ඒ බව ප්‍රදර්ශණය කල යුතු වන අතර ඊට අනුකූලව කටයුතු කල යුතුය.

v. මැතිවරණය පවත්වනු ලබන දිනයේ තම සේවකයින්ට බාධාවකින් තොරව තම ඡන්දය භා
කිරීමට හැකි වන පරිදි ප්‍රමාණවත් කාලයක් නිවාඩු ලබා දීමට කටයුතු කල යුතුය.

03. තවද මැතිවරණ කොමිෂන් සභාවේ අංක EC/EDR/PE/2020/4 හා 2020.03.03 දිනැති චක්‍ර
අංක 03 දරණ චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරන ලෙසත්, මීට අමතරව මැතිවරණ කොමි
සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන උපදෙස් හා නියෝග අනුව කටයුතු කරන ලෙස වැඩිදු
කාරුණිකව දන්වමි.

ආර්.ජී. කන්නන්ගර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
දකුණු පළාත.

පිටපත්-

01. ලේකම්, කෘෂිකර්ම.....සමුපකාර අමාත්‍යාංශය, ලබුදූව - කාරු.දැ.පි
02. සහකාර කොමසාරිස්, (ගාල්ල/මාතර/හම්බන්තොට) - මෙ සම්බන්ධව සියළුම සමු සමිති දැනුවත් කිරීමට
03. සියළුම සමුපකාර සංවර්ධන නිලධාරීන් - අ.ක.ස